# 04 දේශ ගවේෂණ හා යුරෝපා ජාතීන් පෙරදිගට පැමිණීම

### හැඳින්වීම

දේශ ගවේෂණ යනු රටවල් සොයා යාම යන අර්ථය දෙන වදනකි. යුරෝපා ජාතීන් නව මුහුදු මාර්ග සොයා ගනිමින් එතෙක් හඳුනා නොගත් රටවල් සොයා ගැනීම දේශ ගවේෂණ ලෙස විස්තර කෙරේ. 15 වන ශතවර්ෂය අග භාගයේ දී යුරෝපා මහාද්වීපයට බැහැරින් පවතින රටවල් සොයා ගැනීම පිළිබඳ යුරෝපීයන් තුළ බලවත් උනන්දුවක් ඇති විය. එහි ප්‍රතිඵල වශයෙන් ආසියාව, ඇමරිකාව හා අප්‍රිකාව යන මහාද්වීපවල පවතින රටවල් සොයාගෙන ඒවායේ ජනතාව හා සම්පත් පිළිබඳ යුරෝපීයන්ට කරුණු අනාවරණය කර ගැනීමට හැකියාව ලැබුණි. මෙම පරිච්ඡේදයේ දී දේශ ගවේෂණවලට තුඩු දුන් හේතු, ප්‍රධාන ගවේෂණ, ඒ සඳහා මූලික වූ තැනැත්තන් හා යුරෝපීයන් පෙරදිගට පැමිණීම යන කරුණු පිළිබඳ සාකච්ඡා කෙරේ.

## 4.1 දේශ ගවේෂණ කටයුතුවල පසුබිම

15 වන ශතවර්ෂය අගභාගයේ දී දේශ ගවේෂණ ආරම්භ වීමට පෙර, යුරෝපය, උතුරු අප්‍රිකාව හා ආසියාවේ සුළු ප්‍රදේශයක් හැර ලෝකයේ සෙසු ප්‍රදේශ හා රටවල් පිළිබඳ යුරෝපීයන්ට නිසි අවබෝධයක් නොතිබුණි. ආසියාවේ රටවල් වූ ඉන්දියාව හා චීනය පිළිබඳ වෙළෙන්දන් හා මාර්කෝ පෝලෝ වැනි නිර්භීත ගත් කතුවරුන්ගේ කථාවලින් ලැබූ සීමිත අවබෝධයක් යුරෝපීයන්ට තිබුණි. එහෙත් ආසියාවේ සෙසු ප්‍රදේශ ගැන ඔවුන් සතු දැනුම ඉතා ම අල්ප විය. අප්‍රිකාවේ බහුතර ප්‍රදේශයක් ඇතුළුව ඔස්ට්‍රේලියාව හා ඇමරිකා මහාද්වීපය යන ප්‍රදේශ පිළිබඳ එකල පැහැදිලි අවබෝධයක් නොතිබුණි.

දේශ ගවේෂණ ආරම්භ වීමට පෙර කාලයේ දී ලෝක වෙළෙඳාමෙන් වැඩි කොටස මධ්‍යධරණී මුහුද හා ඒ අවට පෙදෙස්වලට සීමා වී තිබිණ.



*රූපය 4.1 වස්කෝදගාමා ඉන්දියාවට පැමිණීම දැක්වෙන කල්පිත චිත්‍රයක්*



*නොමිලේ බෙදාහැරීම සඳහා ය.*

මධ්‍යධරණී මුහුද ආශ්‍රිත වෙළෙඳ නගර වූ ජිනෝවා, ඇලෙක්සැන්ඩ්‍රියා, වැනීසිය හා කළු මුහුද ආසන්නයේ පැවති කොන්ස්තන්තිනෝපල් ආදිය එකල වෙළෙඳාම නිසා සමෘද්ධිමත්ව තිබිණි. මේ කාලයේ දී ආසියාව හා යුරෝපය අතර වෙළෙඳ සබඳතා පැවැත්වූ ප්‍රධාන මාර්ග තුනක් තිබුණි.

1. කොන්ස්තන්තිනෝපල් නගරයේ සිට පර්සියාව, මධ්‍යම ආසියාව හරහා චීනය දක්වා මාර්ගය හෙවත් සේද මාවත

2. කොන්ස්තන්තිනෝපල් නගරයේ සිට මධ්‍යධරණී මුහුද ඔස්සේ මිසරයට (ඊජිප්තුව) පැමිණ රතු මුහුදේ යාත්‍රා කොට ඉන්දියානු සාගරයට පැමිණීම

3. කොන්ස්තන්තිනෝපල් නගරයේ සිට පර්සියන් බොක්ක හරහා ඉන්දියාවේ බටහිර වෙරළට පැමිණීම

ඉහත සඳහන් සේද මාවත ඔස්සේ ගොඩබිමෙන් ගෙන යන ලද වෙළෙඳ ද්‍රව්‍ය කොන්ස්තන්තිනෝපල් නගරයට ලැබුණි. රතු මුහුද හා පර්සියන් බොක්ක ඔස්සේ මුහුදු මගින් භාණ්ඩ රැගෙන යාමේ දී හමු වන ගොඩබිම් මාර්ගවල දී තවලම් භාවිත කෙරිණ. පර්සියන් බොක්ක ඔස්සේ ගෙන ගිය භාණ්ඩ ද කොන්ස්තන්තිනෝපලයේ දී අලෙවි කෙරිණ. රතු මුහුද හා මිසරය ඔස්සේ ප්‍රවාහනය කෙරුණු භාණ්ඩ බොහෝ විට ඇලෙක්සැන්ඩ්‍රියාවේ දී වැනීස් හා ජිනෝවා වෙළෙඳුන් විසින් මිල දී ගන්නා ලදි.

## දේශ ගවේෂණවලට බලපෑ හේතු


☆ **කොන්ස්තන්තිනෝපල් නගරය තුර්කිවරුන්ට යටත්වීම හා යුරෝපීයන්ගේ සාම්ප්‍රදායික වෙළෙඳ මාර්ග අවහිර වීම.**

කොන්ස්තන්තිනෝපල් නගරය තුර්කිවරුන්ට යටත් වීම දේශ ගවේෂණවලට බලපෑ ආසන්නතම හේතුව ලෙස සැලකිය හැකි ය. ඉහත සඳහන් කළ වෙළෙඳ මාර්ග ඔස්සේ යුරෝපයට ගෙන ගිය වෙළෙඳ ද්‍රව්‍ය යුරෝපා වෙළෙඳුන් ලබා ගත් ප්‍රධාන වෙළෙඳ මධ්‍යස්ථානය වූයේ කොන්ස්තන්තිනෝපල් නගරය යි. එහෙත් 1453 වර්ෂයේ දී මෙම නගරය මුස්ලිම් ජාතික තුර්කිවරුන්ට යටත් වීම නිසා ක්‍රිස්තියානි ජාතික යුරෝපා වෙළෙඳුන්ට එතෙක් භාවිත කළ සාම්ප්‍රදායික වෙළෙඳ මාර්ග භාවිත කිරීම දුෂ්කර විය. කොන්ස්තන්තිනෝපලය අල්ලා ගත් තුර්කිවරුන් වෙළෙඳ භාණ්ඩවල මිල වැඩි කිරීම, තීරු ගාස්තු වැඩි කිරීම හා අත්‍යවශ්‍ය වෙළෙඳ ද්‍රව්‍ය කලට වේලාවට නොසැපයීම වැනි හේතු නිසා යුරෝපීයන්ගේ වෙළෙඳාමට බාධා පැමිණුණි. මෙසේ සාම්ප්‍රදායික වෙළෙඳ මාර්ග අවහිර වූ හෙයින් කුළුබඩු සොයා ආසියාවට පැමිණීමට යුරෝපීයන්ට සිදු විය. ආසියාවේ වෙළෙඳ ආධිපත්‍ය මේ වන විට මුස්ලිම්වරුන් සතුව පැවති අතර එය යුරෝපීයන් අතට ගැනීමේ අපේක්ෂාවක් ද පැවතිණ. මේ අනුව ආසියාවට නව මුහුදු මාර්ග සෙවීම පසුපස ලාභ ලැබීමේ අපේක්ෂාව හෙවත් ආර්ථික අරමුණක් පැවති බවක් පෙනේ.

## දේශ ගවේෂණවලට සුදුසු පසුබිමක් යුරෝපය තුළ ගොඩනැගී තිබීම

පුනරුද සමයේ සිදු වූ නව විද්‍යාත්මක සොයාගැනීම් හා චින්තන විපර්යාස නිසා දේශ ගවේෂණවලට සුදුසු පසුබිමක් නිර්මාණය වී තිබුණි. පුනරුද සමයේ දී නිකලස් කොපර්නිකස් වැනි අය ලෝකය ගෝලාකාර බව තහවුරු කළේ ය. එසේ ම ටොලමිගේ ලෝක සිතියම මගින් ලෝකයේ පිහිටීම පිළිබඳ එතෙක් තිබූ දැනුම පුනරුදය නිසා තවත් පුළුල් විය. දිගු මුහුදු ගමන්වල දී මාර්ගය සොයා ගැනීමට ඉවහල් වන මාලිමාව, උතුරු තරු මාපකය ආදිය භාවිතයේ පැවතීමත් දේශ ගවේෂණවලට උපකාරි විය. එසේ ම පුනරුද සමයේ ලැබූ විද්‍යාත්මක දැනුම නිසා ඈත මුහුදේ යාත්‍රා කළ හැකි විශාල නැව් නිපදවීමටත් හැකියාව ලැබුණි.


*නොමිලේ බෙදාහැරීම සඳහා ය.*




සිතියම 4.1 *යුරෝපය හා ආසියාව අතර වෙළෙඳ සම්බන්ධතා පැවැත්වූ පැරණි වෙළෙඳ මාර්ග*



*රූපය 4.2 පැරණි ගොඩබිම් වෙළෙඳ මාර්ගයේ නටබුන් (සේද මාවත)*



*නොමිලේ බෙදාහැරීම සඳහා ය.*

## 4.2 දේශ ගවේෂණවලට රාජ්‍ය අනුග්‍රහය ලැබීම

ඈතින් පිහිටි රටවල් සොයා යාමේ දී මාස ගණන් ගත වන දිගු මුහුදු ගමන්වලට විශාල වශයෙන් ධනය වැය වූ අතර එම ගමන්වල අවදානමක් ද තිබුණි. මෙබඳු ගමන්වල දී ලාභ ලැබීම ද අවිනිශ්චිත විය. මෙවැනි කරුණු නිසා දේශ ගවේෂණවලට මුදල් වැය කිරීමට පෞද්ගලික අංශයට හැකියාවක් නොතිබුණි. එහෙත් යුරෝපයේ නැගී එමින් පැවති ජාතික රාජ්‍ය කිහිපයක් දේශ ගවේෂණවලට අනුග්‍රහ දැක්වීම එම කටයුතුවල සාර්ථකත්වයට හේතු විය. පෘතුගාලය, ස්පාඤ්ඤය හා එංගලන්තය එසේ දේශ ගවේෂණවලට අනුග්‍රහ දැක්වූ රටවලට උදාහරණ වේ.

## යුරෝපීයන්ගේ ආගමික අරමුණ

මේ වන විට මුස්ලිම්වරුන් සතු වූ ආසියාවේ වෙළෙඳ ආධිපත්‍ය යුරෝපීයන් අතට ගැනීම මෙන් ම අලුතෙන් සොයාගන්නා රටවල කතෝලික ආගම පැතිරවීමේ අපේක්ෂාවක් ද දේශ ගවේෂණ සමග පැවතිණ. වස්කෝදගාමා ඉන්දියාවට පැමිණීමෙන් පසු "ක්‍රිස්තියානීන් හා කුළු බඩු සොයා අපි මෙහි පැමිණියෙමු" යැයි ප්‍රකාශ කර තිබේ.

යුරෝපීයන් තුළ පැවති ආර්ථික හා ආගමික අරමුණු මේ ප්‍රකාශයෙන් වුව ද පැහැදිලි වේ. එවකට ප්‍රෙස්ටර් ජෝන් නම් පාලකයෙකු යටතේ පෙරදිග ක්‍රිස්තියානි රාජ්‍යයක් ඇතැයි ඇතැම් යුරෝපීයන් තුළ මිත්‍යා විශ්වාසයක් තිබුණි. එම පාලකයා සොයාගෙන ක්‍රිස්තියානි ආගම පැතිරවීමට ඔහුගේ සහාය ලබා ගත යුතු යැයි ද හැඟීමක් පැවතිණ.

## දේශ ගවේෂණවලට සම්බන්ධ වූ ප්‍රධාන රටවල්

**පෘතුගාලය**

පෘතුගීසීන්ගේ මව් රට වන පෘතුගාලය අයිබීරියන් අර්ධද්වීපය තුළ පිහිටි රටකි. මේ



රූපය 4.3 *වස්කෝද ගාමා*

නිසා පෘතුගීසීන්ට සිය විදේශ සබඳතා පැවැත්වීමට සිදු වූයේ මුහුදු මාර්ග ඔස්සේ ය. එසේ ම පෘතුගීසීහු ස්වභාවයෙන් ම හොඳ නාවිකයෝ වූහ. කොන්ස්තන්තිනෝපලය තුර්කිවරුන්ට යටත් වීමට පෙර සිට ම පෘතුගීසීහු දේශ ගවේෂණ ගැන උනන්දුවක් දක්වමින් සිටියහ.

### නාවික හෙන්රි



රූපය 4.4 *නාවික හෙන්රි*

පෘතුගීසි ජාතිකයෙකු වූ නාවික හෙන්රි 15 වන සියවසේ දී පෘතුගාලයේ නාවික අභ්‍යාස විද්‍යාලයක් ආරම්භ කර නාවික ශිල්පය ඉගැන්වීමට කටයුතු කළේ ය. එම නාවික විද්‍යාලයේ දී සිසුන්ට නාවික ශිල්පය, නැව් තැනවීම, සිතියම් හැදෑරීම, තාරකා ශාස්ත්‍රය වැනි විෂයන් ගැන අවබෝධයක් ලබා දීමට කටයුතු කෙරිණ.

නාවික හෙන්රිගේ මෙම කටයුතු නිසා පෘතුගීසීන්ට දේශ ගවේෂණ ක්ෂේත්‍රයේ ජයග්‍රහණ රැසක් ලබා ගැනීමට හැකි විය.

බර්තොලමියුඩයස්ගේ නායකත්වයෙන් අප්‍රිකාවේ බටහිර වෙරළ තීරයට ගමන් කළ පෘතුගීසි නාවික කණ්ඩායමක් 1488 වර්ෂයේ දී අප්‍රිකාවේ දකුණු කෙළවරට ළඟා විය. එහි දී කුණාටුවකට හසු වූ මෙම නාවිකයෝ එකී ස්ථානය කුණාටුතුඩුව ලෙස නම් කොට ආපසු පෘතුගාලයට ගියහ. මෙය පෘතුගීසීන් ලැබූ විශාල ජයග්‍රහණයක් හා සුබ ලකුණක් ලෙස සැලකූ පෘතුගාල රජු තම නාවිකයන් කුණාටු තුඩුව ලෙස නම් කළ ස්ථානය, සුබ පැතීමේ තුඩුව (Cape of good hope) ලෙස නම් කළේ ය. මෙම මාර්ගය ඔස්සේ ගමන් කළ පෘතුගීසි ජාතික වස්කෝදගාමා ඇතුළු නැව් කණ්ඩායමක් 1498 වර්ෂයේ දී ඉන්දියාවේ කැලිකට් නගරයට පැමිණීමෙන් ආසියාවට නව මුහුදු මාර්ගයක් සෙවීමේ යුරෝපීය අපේක්ෂා මල්පල ගැන්වී ය.



රූපය 4.5 *ක්‍රිස්ටෝපර් කොලොම්බස්*

## ස්පාඤ්ඤය


පෘතුගාලයට නැගෙනහිර දෙසින් පිහිටි ස්පාඤ්ඤය අයිබීරියන් අර්ධද්වීපයේ විශාලතම රට වේ. ස්පාඤ්ඤවරු ද අතීතයේ සිට ම නාවික කටයුතු පිළිබඳ උනන්දුවක් දැක්වූහ. 15 වන සියවසේ අගභාගය වන විට ෆර්ඩිනන්ඩ් හා ඉසබෙලා රාජකීය යුවල යටතේ ස්පාඤ්ඤය ශක්තිමත් රාජ්‍යයක් ලෙස වර්ධනය වෙමින් තිබුණි. ස්පාඤ්ඤයේ ආර්ථික ශක්තිය ද දියුණු වී තිබූ හෙයින් එහි රජය දේශ ගවේෂණ කටයුතුවලට අනුග්‍රහ දැක්වීමට ඉදිරිපත් විය. පෘතුගීසීන් අප්‍රිකාව වටා ගමන් කොට ආසියාවට නව මුහුදු මාර්ගයක් සොයන විට ස්පාඤ්ඤ නාවිකයෝ අත්ලාන්තික් සාගරයේ බටහිරට ගමන්කොට ආසියාවට පැමිණීමේ මාර්ගයක් සෙවීමෙහි නිරත වූහ.

ෆර්ඩිනන්ඩ් හා ඉසබෙලා යුවලගේ ආධාර මත 1492 වර්ෂයේ දී මෙබඳු මුහුදු ගවේෂණයක යෙදුණු ක්‍රිස්ටෝපර් කොලොම්බස් අත්ලන්තික් සාගරයේ බටහිර පිහිටි බහමාස් දූපත් සමූහයේ ඉස්පැනියෝලා දූපතට ගොඩබැස්සේය. එම ගොඩබිම් ප්‍රදේශය ඉන්දියාව යැයි ඔහු කල්පනා කළ අතර එකී දූපත් සමූහය වර්තමානයේ පවා බටහිර ඉන්දියා දූපත් ලෙස හැඳින්වේ. පසුව ඇමෙරිගෝ වෙස්පුච්ගේ මුහුදු ගමන්වලට මෙන් ම ෆර්ඩිනන්ඩ් මැගලන් ලෝකය වටා යාත්‍රා කළ ගමනට ද ස්පාඤ්ඤ අනුග්‍රහය ලැබුණි.

පෘතුගාලය හා ස්පාඤ්ඤය හැරුණු විට එංගලන්තය, ප්‍රංශය හා ඕලන්දය වැනි රටවල් ද දේශ ගවේෂණ කටයුතුවලට යම් පමණකින් දායක වී තිබේ. දේශ ගවේෂණවල නිරත වූ රටවල්, පුද්ගලයන් හා ගවේෂණ කළ ප්‍රදේශ පිළිබඳ සංක්ෂිප්ත විස්තරයක් පහත සටහනින් දැක්වේ.

| අනුග්‍රහ දැක්වූ රට | දේශ ගවේෂකයා | ගවේෂණය කළ ස්ථාන හා සොයා ගත් රටවල් |
|---|---|---|
| පෘතුගාලය | බර්තොලමියුඩයස් | අප්‍රිකාවේ දකුණු කෙළවර පිහිටි තුඩුව දක්වා පැමිණීම. එය කුණාටු තුඩුව ලෙස නම් කිරීම. (පෘතුගාල රජු කුණාටු තුඩුව ශුභ ප්‍රාර්ථනා තුඩුව ලෙස නම් කිරීම) |
| | වස්කෝ ද ගාමා | බර්තොලමියුඩයස්ගේ ගමන් මාර්ගයේ ඉදිරියට ගොස් ඉන්දියාවට ගොඩබැසීම. |
| ස්පාඤ්ඤය | ක්‍රිස්ටෝපර් කොලොම්බස් | අත්ලාන්තික් සාගරයෙන් බටහිරට ගමන් කර කැරිබියන් දූපතට ගොඩබැසීම (ඉස්පැනියෝලාව) මොහුගේ ගවේෂණ නිසා ඇමෙරිකාවට යාම සඳහා මාර්ගය විවෘත වීම. |
| | ඇමෙරිගෝ වෙස්පුචි | කොලොම්බස්ගේ මාර්ගයේ ගොස් ඇමෙරිකාව සොයා ගැනීම (සොයා ගත් මහාද්වීපය මොහුගේ නමින් නම් කිරීම) |
| | ෆර්ඩිනඩ් මැගලන් | ලෝකය වටා ප්‍රථමවරට ගමන් කිරීම. පිලිපීන දූපත්වලට ගොඩබැසීම මෙම ගමන නිසා ලෝකය ගෝලාකාර බව තහවුරු වීම. |
| | ෆර්ඩිනැන්ඩෝ කෝටේස් | මෙක්සිකෝව |
| | ෆ්‍රැන්සිස්කෝ පිසාරෝ | පීරු දේශය |
| එංගලන්තය | කැබේ සොයුරෝ | කැනඩාවේ වෙරළබඩ ප්‍රදේශ |
| ප්‍රංශය | ජැක්මිස් කාටියර් | උතුරු ඇමෙරිකාවේ ශාන්ත ලෝරන්ස් ප්‍රදේශය |
| ඕලන්දය | හෙන්රි හඩ්සන් | උතුරු ඇමෙරිකාවේ හඩ්සන් ගංගාව හා හඩ්සන් බොක්ක අවට ප්‍රදේශය |

වගුව 4.1 *දේශ ගවේෂණ කටයුතුවල කැපී පෙනෙන අවස්ථා*




සිතියම 4.1 *15 වන හා 16 වන සියවස්වල දේශ ගවේෂණ*


*නොමිලේ බෙදාහැරීම සඳහා ය.*

## ෆර්ඩිනන්ඩ් මැගලන් ලෝකය වටා යාත්‍රා කිරීම




රූපය 4.6

1480 වර්ෂයේ දී පමණ පෘතුගාලයේ උපන් ෆර්ඩිනන්ඩ් මැගලන් වයස 25 වන විට නාවිකයෙකු බවට පත් විය. යුරෝපයේ සිට බටහිරට ගමන් කොට ආසියාවට නව මාර්ගයක් සෙවීමේ කුතුහලය නිසා මැගලන් දීර්ඝ මුහුදු ගමනක් සංවිධානය කළේ ය. ස්පාඤ්ඤ රජුගෙන් ඒ සඳහා අවශ්‍ය අනුග්‍රහය ලැබුණි. 1519 වර්ෂයේ දී ස්පාඤ්ඤයේ සිට නැව් කිහිපයක් සමග මැගලන් තම මුහුදු ගමන ආරම්භ කළේ ය.

අත්ලාන්තික් සාගරයට පැමිණි එම නැව් කණ්ඩායම දකුණු ඇමරිකා මහද්වීපයේ දකුණු කෙළවරේ පිහිටි පැසිපික් සාගරයට පිවිසීමේ සමුද්‍ර සන්ධිය සොයා ගත්තේ ය. ඔහුගේ නමින් එය මැගලන් සමුද්‍ර සන්ධිය ලෙස හැඳින්වේ.

අනතුරුව පැසිපික් සාගරය හරහා ගමන් කළ මෙම නාවිකයෝ බොහෝ දුෂ්කරතාවලට මුහුණ දුන්හ. කෙසේ හෝ පැසිපික් සාගරයේ දීර්ඝ මුහුදු ගමනකින් පසුව මැගලන් පිලිපීනයට ළඟා වීමට සමත් විය. පිලිපීනයේ දී ස්වදේශිකයන් සමග ඇති වූ ගැටුමකින් මැගලන් මිය ගියත් ඔහුගේ නැව් කණ්ඩායමේ ඉතිරි පිරිස අප්‍රිකාවේ බටහිර දිගින් යාත්‍රා කොට නැවත ස්පාඤ්ඤයට පැමිණියහ. මැගලන්ගේ මුහුදු ගමන නිසා ලෝකය ගෝලාකාර බවට පළ වෙමින් පැවති මතය තහවුරු විය.




**සිතියම 4.2**
*මැගලන්ගේ ගමන් මාර්ගය*



රූපය 4.7 *පැරණි දේශ ගවේෂකයෝ දේශ ගවේෂණවල යෙදුණේ මෙවැනි රුවල් නැව් ආධාරයෙනි*

## 4.3 යුරෝපා ජාතීන් ආසියාවට පැමිණීම

යුරෝපයේ ග්‍රීක රෝම ශිෂ්ටාචාර පැවති පැරණි යුගයේ දී පවා ආසියාව හා යුරෝපය අතර වෙළෙඳ සබඳතා පැවතුණි.

ග්‍රීක පාලකයෙකු වූ මහා ඇලෙක්සැන්ඩර් ප්‍රබල හමුදාවක් සමග ඉන්දියාව දක්වා ආක්‍රමණය කොට පසුව අරාබි ප්‍රදේශයට යාමත් සමග ආසියාව හා යුරෝපය අතර වෙළෙඳ සබඳතා දියුණු විය. ග්‍රීක ශිෂ්ටාචාරය පරිහානියෙන් පසුව ඉතාලියේ රෝම නගරය මුල් කරගෙන රෝම ශිෂ්ටාචාරය ගොඩනැගුණි. රෝමය පසුව යුරෝපයේ ප්‍රබල අධිරාජ්‍යයක් බවට පත් විය. මෙසේ රෝම ශිෂ්ටාචාරය පැවති සමයේ දී ද යුරෝපය හා ආසියාව අතර වෙළෙඳ සබඳතා පැවතුණි.

රෝම ශිෂ්ටාචාරය පරිහානියට පත් වීමෙන් පසුව යුරෝපයේ දේශපාලන ක්ෂේත්‍රයේ වෙනස්කම් රැසකට මග පෑදිණ. එතෙක් පැවති අධිරාජ්‍ය වෙනුවට එක් එක් ප්‍රදේශ මුල් කරගෙන වෙන ම රාජ්‍ය බිහි විය. මෙම රාජ්‍යවල පාලකයෝ ප්‍රාදේශීය වශයෙන් බලවත්ව සිටි ප්‍රභූවරුන් හෙවත් රදලයන්ගේ සහායෙන් පාලන කටයුතුවල නිරත වූහ. ඉඩම් හිමිකම රදලයන්ටත් ඒවායේ වගා කිරීම සාමාන්‍ය ගොවි ජනතාවටත් පැවරී තිබූ මෙය වැඩවසම් ක්‍රමය ලෙස හැඳින්වේ. වැඩවසම් ක්‍රමය තුළ යුරෝපීයන්ගේ බලපෑම යුරෝපයෙන් පිටතට ව්‍යාප්ත නොවී ය.

යුරෝපයේ දේශපාලන ක්ෂේත්‍රයේ මෙබඳු තත්වයක් පැවති අවධියේ මැද පෙරදිග හා ආසියාවේ ඇතැම් ප්‍රදේශවල මුස්ලිම් වෙළෙඳ බලය ව්‍යාප්ත විය. එහි ප්‍රතිඵලයක් වශයෙන් අරාබිය, පර්සියාව, හා මිසරය වැනි ප්‍රදේශවලින් පැමිණි මුස්ලිම් වෙළෙන්දෝ ආසියාව හා


*නොමිලේ බෙදාහැරීම සඳහා ය.*

යුරෝපය අතර වෙළෙඳාමේ අතරමැදියන් ලෙස ක්‍රියා කළහ. මෙම වෙළෙන්දෝ රුවල් නැව් යොදා ගනිමින් අවශ්‍ය වෙළෙඳ ද්‍රව්‍ය විවිධ රටවලින් එකතු කොට ඉහත සඳහන් කළ වෙළෙඳ මාර්ග ඔස්සේ කොන්ස්තන්තිනෝපල් වරායට ගෙන ගියහ.

ආසියාවෙන් යුරෝපයට ගෙන ගිය භාණ්ඩ අතර චීනයෙන් සේද රෙදි, සුවඳ විලවුන්, පිඟන් භාණ්ඩ හා සතුන් ජපානයෙන් රිදී, ශ්‍රී ලංකාවෙන් මුතු මැණික් කුළු බඩු ඇතුන් හා ඇත් දත් ආදිය වැදගත් විය. එසේ ම ඉන්දියාවෙන් ගම්මිරිස්, කුරුඳු, අබිං, කපු රෙදි වැනි දේ ද ජාවා, සුමාත්‍රා, බෝර්නියෝ වැනි නැගෙනහිර ඉන්දියානු දූපත්වලින් කරාබු නැටි, කරදමුංගු, සාදික්කා ආදි කුළු බඩු වර්ග ද යුරෝපයට රැගෙන යන ලදි. ආසියාවෙන් ගෙන යන ලද කුළු බඩු වර්ගවලට යුරෝපයේ ඉහළ ඉල්ලුමක් පැවති අතර යුරෝපීයන්ගේ ආහාර රසවත් කර ගැනීමට එම කුළු බඩු අත්‍යවශ්‍ය වී තිබුණි.

මෙසේ යුරෝපය හා ආසියාව අතර අතරමැදි වෙළෙඳුන් වශයෙන් කටයුතු කරමින් මුස්ලිම් ජාතිකයෝ විශාල ලාභයක් ලබාගෙන ශක්තිමත් වූහ. මුස්ලිම් ජාතිකයන් ආර්ථික අතින් ශක්තිමත් වී තම දේශපාලන බලය ව්‍යාප්ත කරමින් සිටි අවධියේ කොන්ස්තන්තිනෝපල් නගරය මුස්ලිම් බලයක් සහිත තුර්කියට යටත් වීම යුරෝපීයන්ගේ වෙළෙඳාමට ප්‍රබල බාධාවක් විය. එහි ප්‍රතිඵල වශයෙන් ආසියාවට පැමිණීමේ නව මුහුදු මාර්ගයක් සෙවීමට යුරෝපීයන් කටයුතු කළ ආකාරය මෙම පාඩම ආරම්භයේ දී විස්තර කෙරිණ.

### යුරෝපීයන් ආසියාවට පැමිණීමේ අරමුණු

- ✯ ආසියාවේ නිෂ්පාදනය කෙරුණු කුළු බඩු ඇතුළු සෙසු වෙළෙඳ ද්‍රව්‍ය ලබා ගෙන යුරෝපයට ගෙන ගොස් අලෙවි කොට ආර්ථික වශයෙන් ලාභ ලබා ගැනීම.
- ✯ මුස්ලිම් ජාතිකයන් සතු වූ ආසියාවේ වෙළෙඳ ඒකාධිකාරය යුරෝපීයන් අතට ලබා ගැනීම.
- ✯ ආසියාතික රටවල තම ආගම පැතිරවීම.

16 වන සියවස ආරම්භයේ දී යුරෝපීයන් ආසියාවට පැමිණීමේ මූලික අරමුණ මෙබඳු වුවත් යුරෝපයේ කලින් කලට ඇති වූ දේශපාලන හා ආර්ථික වෙනස්කම් අනුව මෙම අරමුණුවල ද වෙනස්කම් ඇති වූ බව පෙනේ.

## පෘතුගීසීන් ආසියාවට පැමිණීම

යුරෝපීයන් අතුරින් ප්‍රථමයෙන් ම ආසියාවට පැමිණියේ පෘතුගීසීන් ය. 1498 වර්ෂයේ දී වස්කෝදගාමා ඉන්දියාවේ කැලිකට්වලට පැමිණීමත් සමග ඒ සඳහා මග විවර විය. වස්කෝදගාමා විශාල වස්තු සම්භාරයක් සහිතව නැවත පෘතුගාලයට පැමිණි විට පෘතුගාල රජු මහත් සතුටට පත්ව ඇත. ආසියාව සමග දිගට ම වෙළෙඳ සබඳතා පවත්වා ගත හොත් අතිවිශාල ලාභයක් ලැබිය හැකි බව රජුට පෙනී ගියේ ය. ඒ අනුව පෘතුගීසීන් මුලින් ම ඉන්දියාවේ වෙරළබඩ රාජධානි සමග සබඳතා ගොඩනගා ගත්තේ ය. අනතුරුව ලංකාවට ද පැමිණි ඔවුහු කෝට්ටේ රාජධානිය සමග සබඳතා ඇති කර ගත්හ. පෘතුගාලයේ සිට ආසියාවේ කටයුතු මෙහෙයවීම දුෂ්කර වූ බැවින් පෘතුගීසීහු ගෝව අල්ලාගෙන එය පෙරදිග පෘතුගීසි මධ්‍යස්ථානය බවට පත් කර ගත්හ. මේ අතර අග්නිදිග ආසියාවේ කුළුබඩු වැවෙන දූපත් කිහිපයක් ද අල්ලා ගත් ඔවුහු ඉන්දියානු සාගරය ආශ්‍රිතව වැදගත් වෙළෙඳ බලයක් ගොඩනැගූහ.

## ලන්දේසීන් පැමිණීම

පෘතුගීසීන් ආසියාවට පැමිණ ශතවර්ෂයකට ආසන්න කාලයක් ගතවන තෙක් ලන්දේසීන්ට ආසියාවට පැමිණීමට හැකියාවක් නොලැබුණි. 1595 වර්ෂයේ සිට ලන්දේසීහු ආසියාවට පැමිණීමට පටන් ගත්හ. එතැන් සිට 1602 වර්ෂය පමණ වන තෙක් ඕලන්දයේ පිහිටුවා තිබූ වෙළෙඳ සමාගම් කිහිපයක් වරින් වර ආසියාවට පැමිණුණි. එක ම රටක වෙළෙඳ සමාගම් කිහිපයක් පැමිණීම නිසා


නොමිලේ බෙදාහැරීම සඳහා ය.

ආසියාවේ දී එම සමාගම් අතර තරගයක් ද ඇති විය. එසේ ම කුඩා කුඩා සමාගම් පැමිණීම නිසා ආසියාවේ ප්‍රදේශ අත්පත් කර ගැනීමට හෝ පෘතුගීසි තර්ජනවලට සාර්ථකව මුහුණ දීමට ලන්දේසීන්ට අපහසු විය. මෙම තත්වය තේරුම්ගත් ඕලන්ද පාලකයා 1602 වර්ෂයේ දී වෙළෙඳ සමාගම් කිහිපයක් එකතු කොට ශක්තිමත් සංවිධානයක් වශයෙන් පෙරදිග ඕලන්ද වෙළෙඳ සමාගම හෙවත් 'VOC' සමාගම පිහිටුවිය. එතැන් සිට ලන්දේසීන් වෙනුවෙන් ආසියාවේ සියලු කටයුතු සිදු කරන ලද්දේ 'VOC' සමාගම විසිනි.

ලන්දේසීහු මුල් කාලයේ දී ආසියාවේ කුළු බඩු බහුලව නිෂ්පාදනය කෙරෙන අග්නිදිග ආසියානු දූපතක් කෙරෙහි වැඩි සැලකිල්ලක් දැක්වූහ. එසේ ම ඉන්දියාවේ වෙරළබඩ තීරයේ වෙළෙඳ ගබඩා රැසක් පිහිටුවූ ඔවුහු අග්නිදිග ආසියාතික ප්‍රදේශවලින් පෘතුගීසීන් පලවා හැරීමට කටයුතු කළහ. ලන්දේසීන්ගේ පෙරදිග මූලස්ථානය අග්නිදිග ආසියාතික ප්‍රදේශයක් වන බතාවියේ පිහිටුවන ලදි. මෙසේ 17 වන ශතවර්ෂයේ මැද වන විට පෙරදිග පෘතුගීසි වෙළෙඳ ආධිපත්‍ය තමන් වෙතට ලබා ගැනීමට ලන්දේසීහු ක්‍රියා කළහ.

## බ්‍රිතාන්‍යයන් හා ප්‍රංශ ජාතිකයන්ගේ පැමිණීම

පෘතුගීසීන්ට මෙන් ලන්දේසීන්ට දිගු කලක් ආසියාවේ වෙළෙඳ ආධිපත්‍ය රැක ගැනීමට නොහැකි විය. ඊට හේතු වූයේ බ්‍රිතාන්‍යයන් හා ප්‍රංශ ජාතිකයන්ගේ පැමිණීම යි. ඉංග්‍රීසීහු පෙරදිග ඉන්දියානු ඉංග්‍රීසි වෙළෙඳ සමාගම පිහිටුවා එංගලන්තයේ රැජිනගෙන් ආසියාවේ වෙළෙඳාම පිළිබඳ ඒකාධිකාරී බලයක් ලබා ගෙන 17 වන සියවස ආරම්භයේ සිට ආසියාවට පැමිණියහ. ඔවුහු ඉන්දියානු වෙරළබඩ ප්‍රදේශයේ වෙළෙඳ ගබඩා කිහිපයක් පිහිටුවා පසුව ක්‍රමානුකූලව තම බලය ව්‍යාප්ත කිරීමේ ප්‍රතිපත්තියක් අනුගමනය කළහ. එහි ප්‍රතිඵලය වශයෙන් ඉන්දියාව, බුරුමය හා ශ්‍රී ලංකාව ද පසුව බ්‍රිතාන්‍ය යටත් විජිත බවට පත් විය.

ප්‍රංශ ජාතිකයෝ 17 වන සියවසේ මැද වන විට පෙරදිග ප්‍රංශ වෙළෙඳ සමාගම පිහිටුවා ආසියාවට පැමිණීමට පටන් ගත්හ. ඔවුහු මුල් කාලයේ දී ඉන්දියාවේ පොන්ඩිචේරි, කරිකාල් හා චන්ද්‍රනගර් වැනි ස්ථානවල වෙළෙඳ ගබඩා පිහිටුවා තම බලය ව්‍යාප්ත කිරීමට කටයුතු කළහ. මෙසේ 17 වන සියවසේ අග භාගය වන විට යුරෝපා ජාතීන් කිහිපයක් ම ආසියාවට පැමිණ සිටි හෙයින් ආසියාවේ දේශපාලන බල ව්‍යාප්තිය හා වෙළෙඳ බලය ලබා ගැනීම වෙනුවෙන් ඔවුනොවුන් අතර ම ගැටුම් ඇති විය. එම ගැටුම් නිසා එක් යුරෝපා ජාතියකට එරෙහිව තවත් යුරෝපා ජාතියකගෙන් ආධාර ලබා ගැනීමට ආසියානු රටවල පාලකයන්ට අවකාශ සැලසිණි.



### ක්‍රියාකාරකම

1. පහත සඳහන් රටවල් හා ස්ථාන ලෝක සිතියමක ලකුණු කරන්න.

   පෘතුගාලය, ඕලන්දය, ස්පාඤ්ඤය, ප්‍රංශය, එංගලන්තය, සුබ පැතීමේ තුඩුව, කැලිකට් වරාය, කොන්ස්තන්තිනෝපල්, රෝමය, ජිනෝවා

2. යුරෝපීයන් දේශ ගවේෂණය සඳහා යොමු වීමට හේතු ලියන්න.